**www.wsws.org**

**ලෝක සමාජවාදී වෙබ් අඩවිය**

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ඉහලම ජෙනරාල් ජනාධිපති අපේක්ෂකයකු ලෙස මතුවීමේ හැකියාවක්

## Sri Lanka's top general emerges as possible presidential candidate

**සරත් කුමාර සහ කේ. රත්නායක විසිනි**
**2009 නොවැම්බර් 9**

ලබන වසරේ මුල ජනාධිපතිවරනයක් පැවැත්වීමේ හැකියාවත් සමග, ශ්‍රී ලංකාවේ ආරක්ෂක මාන්ඩලික ප්‍රධානි, ජෙනරාල් සරත් ෆොන්සේකා, ජනාධිපති මහින්ද රාජපක්ෂට අභියෝග කරනු පිනිස විපාර්ශ්වික පක්ෂවල විය හැකි පොදු අපේක්ෂකයා ලෙස මතුවෙමින් තිබේ. ෆොන්සේකාට ලැබෙන පිටුබලය මගින් අවධාරනය කෙරෙන්නේ, කොලඹ සමස්ත දේශපාලන සංස්ථාපිතයම මිලිටරිය මත කෙතරම් නම් දුරට වාරු වන්නේ ද යන වගයි.

ජනාධිපති රාජපක්ෂ, රටේ දරුනු වන ආර්ථික අර්බුදයෙන්, ජීවන මට්ටම් අඛන්ඩව කඩාවැටීමෙන් සහ ආන්ඩුව ප්‍රජාතන්ත්‍ර අයිතීන් උල්ලංඝනය කිරීමෙන් මහජන අවධානය වෙනතකට යොමු කරනු වස් ජයොන්මාදයේ හා වර්ගෝත්තමවාදයේ වාතාවරනයක් අවුලුවාලනු පිනිස, හමුදාව මැයි මස බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය පරාජය කිරීම ගසාකමින් සිටී. දෙමල සිවිල් වැසියන් 250,000ක් පමන තථ්‍යසමාන යුද සිරකරුවන් ලෙස මිලිටරිය විසින් පාලනය කරනු ලබන ජරාජීර්න රැඳවුම් කඳවුරුවල නීති විරෝධී ලෙස තවමත් සිරකර ගෙන සිටී.

වැඩෙන මහජන අසන්තෘප්තිය පිලිබඳව පැහැදිලිවම උත්සුකව, රාජපක්ෂ අගවා ඇත්තේ 2011 නොවැම්බර් වන තෙක් නියමිතව නැති ජනාධිපතිවරනය ලබන වසරේ මුල පැවැත්වීම ගැන තමන් සලකා බලමින් සිටින බවයි. ලබන මාර්තු මාසයට පෙර පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරනයට පෙර ජනාධිපතිවරනය කැඳවීමට පවා ඉඩ ඇත. මැයි මස සිට පලාත් සභා මැතිවරන මාලාවක් පවත්වා ආන්ඩුව දැනටමත් තත්වය මැන බලා ඇත.

විපක්ෂයේ ප්‍රධාන පක්ෂවලට -- දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂයට (එජාප) සහ සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුනට (ජවිපෙ) -- ආන්ඩුව සමග අතිමූලික මතභේද කිසිවක් නැත. එම පක්ෂ දෙකම එල්ටීටීඊයට එරෙහි වර්ගවාදී යුද්ධයට පිටුබලය දුන් අතර දෙමල සිවිල් වැසියන් සිරකර ගෙන සිටීමට සහයෝගය දෙයි. එමෙන් ම ඔවුහු දරුනු හදිසි නීති රෙගුලාසි දිගටම පවත්වා ගෙන යාමට නිතිපතා ඡන්දය දෙන අතර, ආන්ඩුවේ "නාස්තිය හා දූෂනය" පිලිබඳ ඔවුන්ගේ සියලු ජනතාවාදී විවේචන කෙසේවෙතත්, ඔවුහු ආන්ඩුවේ ප්‍රතිගාමී ආර්ථික පිලිවෙත්වලට එකග ය.

ආන්ඩුවේ පිලිවෙත්වලට විරුද්ධ වනවා වෙනුවට, එජාප සහ ජවිපෙ බලාපොරොත්තු වන්නේ, එල්ටීටීඊය පරාජය කිරීමට වගකිව යුතු "රනවිරුවා" ලෙස රටේ ඉහලම ජෙනරාල්වරයා හුවාදැක්වීම මගින් රාජපක්ෂ පරාජය කල හැකි බවයි. එමෙන් ම, මැතිවරන සන්ධානයක් තැනීමෙන් තොරව පොදු අපේක්ෂකයකුට සහයෝගය දීම පිනිස එකට එකතුවීමේ අවස්ථාව එය එජාපයට හා ජවිපෙට ලබා දෙනු ඇත.

තමන් පොදු අපේක්ෂකයකු ලෙස ෆොන්සේකාට සහයෝගය දෙන බව ජවිපෙ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර ඇත. ජෙනරාල් සහ එජාප නායකයන් අතර පුද්ගලික සාකච්ඡා පැවති බවට එක දිගට මාධ්‍ය කටකතා වාර්තාවීමෙන් පසුව, ඊයේ සන්ඬේ ටයිම්ස් පත්‍රය වාර්තා කලේ, අලුතෙන් ගොඩනගන ලද එක්සත් ජාතික පෙරමුන (එජාපෙ) ෆොන්සේකාට සහයෝගය දීමට පසුගිය සතියේ දී ඒකමතිකත්වයකට පැමිනි බවයි. එජාපෙ යනු කුඩා පක්ෂ නවයක් සහිත එජාප විසින් නායකත්වය දෙනු ලබන සන්ධානයකි.

ෆොන්සේකා විපක්ෂයේ අපේක්ෂකයා වුවත් නැතත්, ඔහු රාජපක්ෂ සමග විරසක වී ඇති බවට පැහැදිලි ලකුනු පවතී. ජනාධිපති ලෙස රාජපක්ෂ කල ප්‍රථම ක්‍රියාවන්ගෙන් එකක් වූයේ, ෆොන්සේකාගේ පූර්වප්‍රාප්තිකයාට ඉල්ලා අස්වන ලෙස බල කිරීමෙන් පසුව, 2005 දෙසැම්බරයේ දී ඔහු යුද හමුදාපති ලෙස පත් කිරීමයි. සිය ක්ෂමාවිරහිත මිලිටරි විධික්‍රම සම්බන්ධයෙන් ප්‍රසිද්ධ ජෙනරාල්වරයකු හමුදාපති ලෙස පත් කිරීම, එල්ටීටීඊය සමග 2002 දී ඇති කර ගත් සටන් විරාමය බිඳ දමා 2006 මැද දී රට යලි යුද්ධයට ඇද දැමීම පිනිස රාජපක්ෂ කල සූදානමේ කොටසක් විය.

ෆොන්සේකා, යුද්ධය ගෙන ගිය ප්‍රජාතන්ත්‍ර අයිතීන් පාගා දැමූ සහ අනේක යුද අපරාධ සම්බන්ධයෙන් සෘජුවම වගකිව යුතු ජනාධිපති රාජපක්ෂ වටා සිටි සමීපව බැඳුනු කල්ලියේ කොටසක් විය. යුද්ධයේ අවසන් මාසයේ දී, එල්ටීටීඊ-පාලිත භූමි ප්‍රදේශයෙන් ඉතිරිව පැවති කොටසේ පැවති ඊනියා "යුද මුක්ත කලාපයක්" තුල කොටු වී සිටි සිවිල් ජනයා මත ඉවබවක් නැතිව බෝම්බ හෙලීම ඇතුලු මෙහෙයුම්වලට ෆොන්සේකා සෘජුවම නායකත්වය දුන්නේය. එක්සත් ජාතීන්ගේ තක්සේරුවලට අනුව, ජනවාරි සිට මැයි දක්වා කාල පරිච්ඡේදය තුල දී අඩු ගනනේ සිවිල් වැසියන් 7,000ක් ඝාතනයට ලක් විය.

වසර 26ක සිවිල් යුද්ධය තුල දී, ශ්‍රී ලංකාවේ මිලිටරිය දැවැන්ත ලෙස ප්‍රසාරනය වී ඇති අතර සමාජයේ සෑම අංශයක් ම වැඩිවැඩියෙන් මිලිටරීකරනයට ලක්ව තිබේ. ආරක්ෂක වියදම් දල දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1978 දී තිබූ සියයට 1.5 සිට 2008 දී සියයට 4.5 දක්වා ඉහල නැගුනි. සන්නද්ධ හමුදාවල ශක්තිය 300,000ක් පමන වන්නේ, එය ලෝකයේ ඒක පුද්ගල මට්ටමෙන් විශාලතම හමුදාවලින් එකක් බවට පත් කරමිනි.

මිලිටරියේ වැඩෙන දේශපාලන ක්‍රියාකලාපය පිලිබිඹු කරමින්, ෆොන්සේකා නැවතනැවතත් මාධ්‍යවලට ප්‍රකාශ නිකුත් කලේය. සමස්ත කොලඹ සංස්ථාපිතයටම කාවැදී පවතින සිංහල අධිපතිවාදය කෙලින්ම ප්‍රකාශයට පත් කරමින්, ඔහු පසුගිය වසරේ දී කැනේඩියානු-පාදක නැෂනල් පෝස්ට් පත්‍රයට මෙසේ පැවසීය: "මේ රට සිංහලයන්ට අයිති යයි මම බලගතු ලෙස විශ්වාස කරනවා." සෙසු ජනවර්ගවලට "අපිත් එක්ක මේ රටේ ජීවත් වෙන්න පුලුවන්" යයි ඔහු තව දුරටත් පැවසිය. "නමුත් ඔවුන්, සුලුතරයක් වීමේ කඩතුරාව යටතේ, හිමි නැති දේවල් ඉල්ලන්න උත්සාහ නොකල යුතුයි."

ෆොන්සේකා රාජපක්ෂ සමග විරසක වී ඇත්තේ මන්ද යන වග තවමත් පැහැදිලි නැත. ඔහු තමා ජනාධිපති අපේක්ෂකයකු වීමට ඉඩ ඇති බව ප්‍රකාශයට පත් කර නැති අතර සිය මතභේද සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ කතා කර නැත. මිලිටරියේ නිලධාරි මට්ටම් තුල පවතින වඩා පුලුල් අසන්තෘප්තිය පිලිබිඹු කරමින්, එල්ටීටීඊයේ පරාජයේ සැලසුම්කරුවන් ලෙස ජනාධිපති සහ ඔහුගේ සොහොයුරු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ කැපී පෙනීම ගැන ජෙනරාල් අමනාපයෙන් පසු වන බව නිසැකය.

පසුගිය මාසයේ පැවති යුද හමුදාවේ 60 වන සංවත්සර උත්සවයේ දී ෆොන්සේකා මෙසේ ප්‍රකාශ කලේය: "ජාත්‍යන්තර ප්‍රජාව පුදුමයට පත් කරමින්, 30 අවුරුදු යුද්ධය අවසන් කරමින්, ශ්‍රී ලංකවේ හමුදාව එල්ටීටීඊය අතුගා දැමීම හුදෙක් වාසනාව නිසා සිදු වූ දෙයක් නොවේ. මෙම ජයග්‍රහනය ලබා ගන්න බොහෝ කැප කිරීම් හා සේවයක් කරන්න හමුදාවට සිදු වුනා. . . . මගේ සමස්ත සැලසුම් හා අධීක්ෂනයත් නිලධාරින්ගේ හා සොල්දාදුවන්ගේ කැපවීමත් වඩාත්ම වැදගත් හේතුව වුනා."

ජනාධිපති රාජපක්ෂ, ෆොන්සේකා විසින් මතු කරනු ලබන දේශපාලන අන්තරාය ගැන මැනවින් දැනුවත්ව, ජෙනරාල් කොන් කිරීමේ ප්‍රයත්නයක යෙදී සිටී. ජූනි මාසයේ දී ෆොන්සේකා ආරක්ෂක මාන්ඩලික ප්‍රධානි ලෙස පත් කෙරුනු අතර, එම තනතුරේ බලතල විශේෂ පාර්ලිමේන්තු පනතක් මගින් පුලුල් කරන ලදි. කෙසේවෙතත්. මෙම උසස්වීම, බලගතු යුද හමුදාව සමග පවතින සියලු සෘජු සබඳතාවන්ගෙන් ජෙනරාල් ඉවත් කිරීම ද සිදු කලේය.

රාජ්‍ය මාධ්‍ය තුල, මිලිටරි ජයග්‍රහනය සඳහා වගකිව යුතු ජාතික වීරයන්ගේ ලැයිස්තුවෙන් ෆොන්සේකා තථ්‍ය වසයෙන් ඉවත් කරනු ලැබ තිබේ. කම්කරු ඇමති මර්වින් සිල්වා මෑත දී පැවති ප්‍රසිද්ධ රැස්වීමක දී කියා සිටියේ, ජනාධිපතිට සහ ආරක්ෂක ලේකම්ට පමනක් "මිලිටරි ජයග්‍රහනය පිලිබඳ කීර්තිය හිමි විය" යුතු අතර "එම නම් දෙක පමනක් ඉතිහාසයට ඇතුලත් වනු ඇති" බවයි. මතභේද පිලිබඳ ලකුනු පැනනගිත්ම, ආරක්ෂක අමාත්‍යංශය, සේවයේ නියුතු මිලිටරි අන දෙන නිලධාරින් පිලිබඳ ලිපි තහනම් කරමින් ද එය නොතකන අයට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගන්නා බවට තර්ජනය කරමින් ද පසුගිය මාසයේ දී ප්‍රවෘත්ති නිවේදනයක් නිකුත් කලේය.

ෆොන්සේකා සිය ආගමනික ග්‍රීන් කාඩ් වීසා බලපත්‍රය අලුත් කරගනු පිනිස එක්සත් ජනපදයට ගිය අවස්ථාවේ පසුගිය සතියේ දී මතභේද පිලිබඳ තවත් දර්ශකයක් මතු විය. එක්සත් ජනපදයේ ස්වදේශීය ආරක්ෂක දෙපාර්තමේන්තුව ස්වේච්ඡා සම්මුඛ සාකච්ඡාවකට සහභාගි වන ලෙස ෆොන්සේකාගෙන් ඉල්ලා සිටි අතර ඒ ඔහුගේ යුද අපරාධ පිලිබඳව ප්‍රශ්න කිරීම සඳහා යයි වාර්තා විය. ඊට යන්තම් සති දෙකකට පෙරාතුව, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව, යුද්ධයේ අවසන් මාසවල දී, රෝහල් ඇතුලු සිවිල් ඉලක්කවලට එල්ල වූ මිලිටරි ප්‍රහාර පිලිබඳ දීර්ඝ ලැයිස්තුවක් ඉදිරිපත් කරමින්, වාර්තාවක් නිකුත් කලේය.

එම ප්‍රවෘත්තිය ශ්‍රී ලංකා ආන්ඩුව වෙතින් කෝපාවිෂ්ට ප්‍රතිචාරයක් අවුලුවාලිය. එය ස්වදේශීය ආරක්ෂක

දෙපාර්තමේන්තු සම්මුඛ සාකච්ඡාව වලකාලීම පිනිස කල හැකි සියලු දේ කලේය. විදේශ ඇමති රෝහිත බෝගොල්ලාගම කොලඹ එක්සත් ජනපද තානාපතිට කතා කොට ජෙනරාල් සම්මුඛ සාකච්ඡාවකට ලක් කිරීමේ සියලු ප්‍රයත්නයන් අතහැර දමන ලෙස එක්සත් ජනපදයෙන් ඉල්ලා සිටියේය. සිය නිල රාජකාරි ක්‍රියාදාමය තුල දී ෆොන්සේකාට දැනගැනීමට ලැබුනු මොනයම් හෝ තොරතුරක් "වරප්‍රසාදිත" දෙයක් වන අතර ඒවා තෙවන පාර්ශ්වයක් වෙත ලබා දිය නොහැකි බව ඔහු ප්‍රවෘත්ති සාකච්ඡාවක දී කියා සිටියේය. අවසානයේ දී, ආන්ඩුව එක්සත් ජනපදයෙන් ඉල්ලා සිටියේ හදිසි කටයුත්තක් හේතු කොට ගෙන ශ්‍රී ලංකාවට ආපසු පැමිනිමට ෆොන්සේකාට ඉඩ දෙන ලෙසයි. ඔහු බ්‍රහස්පතින්දා ආපසු පැමිනියේය.

ඊයේ සන්ඩේ ටයිම්ස් පත්‍රයේ පල වූ දීර්ඝ වාර්තාවකට අනුව, සම්මුඛ සාකච්ඡාවේ ප්‍රධාන ඉලක්කය වූයේ ෆොන්සේකා නොව, ජනාධිපතිගේ සොහොයුරා ය. ඔවුන් එක්සත් ජනපද පුරවැසියන් ලෙස මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධිත ප්‍රතිපත්තිමය තීන්දු ගැනීමට මැදිහත් වූයේ ද වන වග විමසමින් ගෝඨාභය රාජපක්ෂට, ජනාධිපතිගේ තවත් සොහොයුරකු වන බැසිල් රාජපක්ෂට සහ අධිකරන ඇමති මිලින්ද මොරගොඩට එක්සත් ජනපදය දැනටමත් ලිපි යවා ඇති බවක් පෙනී යයි. ඔවුන් තිදෙනාම එක්සත් ජනපද-ශ්‍රී ලංකා ද්විත්ව පුරවැසිභාවය දරයි.

ෆොන්සේකා ආන්ඩුවේ අපරාධ ගැන සාක්ෂ්‍ය ඉදිරිපත් කරනු ඇතැයි ආන්ඩුව ගැඹුරින්ම උත්සුක වූ බව පැහැදිලි ය. ආරක්ෂක සංස්ථාපිතයේ ඉහල ම තනතුරුවල සිටින අතලොස්සක් පමනක් දැන සිටි, යුද්ධයේ අවසන් අදියරවලට සම්බන්ධිත, "අතිශයින්ම සංවේදී" කරුනු ලෙස ඔහු විස්තර කල සිද්ධීන්වලට, ෆොන්සේකා, ආන්ඩුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීන් සමග පැවති මෑත සාකච්ඡාවක දී සැඳහුම් කල බව පුවත්පත් වාර්තාවක් සඳහන් කලේය. කෙසේ වෙතත්, තමන්ට මුක්තිය ලැබෙන බවට සහතික කල හැකි නම් පමනක් එක්සත් ජනපදයට එවන් තොරතුරු ලබා දීමට ෆොන්සේකා සූදානම් වනු ඇත.

ෆොන්සේකා නොව ඒ වෙනුවට ගෝඨාභය රාජපක්ෂ ඉලක්ක කරගැනීමේ එක්සත් ජනපද තීන්දුව එහි යටින් පවතින ගාමකයන් අවධාරනය කරයි. ඒවාට ශ්‍රී ලංකාවේ යුද අපරාධ සහ මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් පවත්නා උත්සුකතාවන් සමග කිසිදු සම්බන්ධයක් නැති අතර ඒ වෙනුවට ඒවායේ එල්ලය වන්නේ, එක්සත් ජනපදයේ ප්‍රතිවාදීන්, විශේෂයෙන් ම චීනය, සමග පවත්නා එහි වැඩෙන ආර්ථික හා දේශපාලන සබඳතා අරභයා රාජපක්ෂ ආන්ඩුවට පීඩනය දැමීමයි. රාජපක්ෂ සහෝදරයන්ට වලකැපීම මගින් වොෂිංටනය බොහෝ විට බලාපොරොත්තු වන්නේ සිය අවශ්‍යතාවන්ට වඩා නතු ආන්ඩුවක් ස්ථාපිත කිරීමයි. එජාපය විශේෂයෙන් ම අතීතයේ දී එක්සත් ජනපදය සමග සමීපව පෙලගැසීම සම්බන්ධයෙන් කැපී පෙනෙයි.

ශ්‍රී ලංකාව තුල, එජාප සහ ජවිපෙ යන දෙපක්ෂය ම බලගතු විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම පිනිස උද්ඝෝෂනය කරන බව පෙන්නුම් කර ඇත. වර්තමානයේ දී ජනාධිපතිට පුලුල් ව්‍යවස්ථාමය බලතල ඇත. ආරක්ෂක හා මුදල් ඇමති තනතුරු ද දරන රාජපක්ෂට, ජනාධිපති ආඥාවන් නිකුත් කිරීම ද හදිසි අවස්ථා රෙගුලාසි යටතේ මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් අහෝසි කිරීම ද කල හැකි ය.

විධායක ජනාධිපති ක්‍රමයට එරෙහි උද්ඝෝෂනය වැඩ කරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් ආරක්ෂා කිරීම පිලිබඳව නොවේ. රාජපක්ෂ වැඩිවැඩියෙන් අනුගමනය කරන අත්තනෝමතික පාලන විධික්‍රම, විශේෂයෙන් ම ගැඹුරු වන ආර්ථික හා සමාජ අර්බුදයක කොන්දේසි යටතේ, මහජන ප්‍රතිප්‍රහාරයක් අවුලුවාලනු ඇති බවට කොලඹ දේශපාලන සංස්ථාපිතයේ කොටස් උත්සුක වී තිබේ.

යුද්ධය තුල දී, මිලිටරි ප්‍රයත්නය සඳහා වැඩ කරන ජනතාව කැප කිරීම කල යුතු යැයි රාජපක්ෂ නැවත නැවතත් ඉල්ලා සිටියේ ය. දැවැන්ත ආරක්ෂක වියදම්වල බරින් දැනටමත් මැඩී ඇති රටේ ආර්ථිකය, යුද්ධයේ අවසානයේ පටන්, ගෝලීය ආර්ථික පසුබැස්මේ පහරට ද ලක්ව තිබේ. ආන්ඩුව දැන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉල්ලා ඇති තදබල කප්පාදු පිලිවෙත් ක්‍රියාවට දමමින් සිටී. යුද්ධයේ අවසානයෙන් පසුව දැනටමත් අරගල මාලවක් ම පැනනැග ඇත. ඒවා විශේෂයෙන් ම, පසුගිය තුන් වසර තිස්සේ ඉහල යන උද්ධමනය මගින් බැරෑරුම් ලෙස බාදනයට ලක්ව ඇති වැටුප් සහ සේවා කොන්දේසි සම්බන්ධයෙනි.

සියලු පූර්ව-මැතිවරන උපාමාරු මගින් පෙන්නුම් කෙරෙන්නේ, කම්කරු පන්තිය සමග ගැටුමක් සඳහා කොලඹ පාලක ප්‍රභූව තිරයට පිටුපසින් තීව්‍ර ලෙස සූදානම් වන බවයි. රාජපක්ෂගේ කල්ලිය සම්බන්ධයෙන් විවේචනශීලී වී ඇති සංස්ථාපිතයේ එම ස්ථරය ම මොන යම් හෝ සමාජ පිපිරීමක් මඩිනු පිනිස ශත වර්ෂ කාර්තුවක යුද්ධය තුල දී ගොඩනගන ලද පොලිස්-රාජ්‍ය යාන්ත්‍රනය යොදාගැනීමට කිසිසේත්ම පැකිලෙනු නැත. රටේ ජනාධිපති ලෙස නියමු පුටුවේ ෆොන්සේකා වාඩි වුව හොත් ඇති වන තත්වය නිසැකව ම එය වනු ඇත.


© www.wsws.org